සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක : - 24 / 2020

මගේ අංකය : - PPSC/ES/11/FI/01/01
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
නවනගරය - රත්නපුර.
2020.10.29

සබරගමුව පළාත් සභාවේ,

01. ප්‍රධාන ලේකම්,
02. ආණ්ඩුකාරවර ලේකම්,
03. සභා ලේකම්/සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,
04. සියළුම පළාත් කොමසාරිස්වරුන් / පළාත් අධ්‍යක්ෂවරුන්,
05. දෙපාර්තුමේන්තු ප්‍රධානීන්,
06. පළාත් පාලන ආයතන වල ලේකම්වරුන් වෙත,

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමේ කාල සීමාව දීර්ඝ කිරීම</u>**

උක්ත කරුණට අදාලව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2020.09.18 දිනැතිව නිකුත් කර ඇති <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 (IV) හා බැලේ.</u>

02. ඒ අනුව පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකර අදාල නිලධාරීන් සිටිනම් ඔවුන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

- සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ එම සේවයට අන්තර්ග්‍රහණය විම සඳහා මීට පෙර අවස්ථාව ලබා දුන් අවසාන දිනය වන 2017.09.30 දින දක්වා මනාපය ප්‍රකාශ කිරීමට නොහැකි වූ එහෙත් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2011.08.01 වන විට මෙම පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිටි MN 4 – 2006 (A) වැටුප් පරිමාණයේ වැටුප් ලබන ලද උපාධිධාරි නිලධාරින්ට සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කිරීමට මෙයින් නැවත අවස්ථාව දෙනු ලැබේ.
- සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන යටතේ 2017.09.30 දිනට පසු මනාපය පළ කර ඇති හා මනාපය පළ කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් හට ( මේ වන විට විනය පරීක්ෂණ වලට භාජනය වී ඇති නිලධාරින් හැර) සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මෙමඟින් අවස්ථාව හිමිවේ.

03. සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය විමට මනාපය පළ කළ හැකි අවසාන දිනය **2020.11.30** ලෙස තිරණය කර ඇත. ඒ අනුව සංවර්ධන නිලධාරි සේවය සඳහා අන්තර්ග්‍රහණයට කැමති නිලධාරින් වේ නම් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ **<u>ඇමුණුම 07</u>** සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා මඟින් 2020.11.30 දින හෝ ඊට පෙර මා වෙත එවිය යුතුය.

04. තවද සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරින්ට එම ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාවක් නොමැති බවද , එම සියලුම නිලධාරීන් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන බවද දන්වා සිටිමි.

පී.එස්.ආර්.එම්.විජයරාජ්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර